# 6 ශ්‍රේණිය සිංහල -2022

## 07 ඒකකය

## 'අලි උවදුර'



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

**06 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 02ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.**

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 07. අලි උවදුර



කුමාරතුංග මුනිදාස සිංහල භාෂා සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි විශාල පෙරළියක් සිදු කළ පඬිවරයෙකි. කුමාරතුංග මුනිදාසයන්ගේ සාහිත්‍ය සේවාව අංශ කිහිපයකට විහිදෙයි. ළමයින් සඳහා රචිත ගද්‍ය හා පද්‍ය නිර්මාණ ඒ අතරින් ප්‍රමුඛ වෙයි.

හත්පණ, හීන්සැරය, මඟුල්කෑම එතුමන් විසින් ළමයින් සඳහා රචිත ප්‍රබන්ධ වන අතර කුමර ගී ආදි පද්‍ය කෘති ඒ ඒ වයස් මට්ටම අනුව ශ්‍රේණිගතව ඉදිරිපත් කර ඇත. පාසල් සිසුන් සඳහා එතුමන් විසින් සම්පාදිත කියවන නුවණ (හයවන ශ්‍රේණිය) කෘතියෙන් උපුටා ගත් කතාවක් මෙහි දැක්වේ.

- **අරුත් පැහැදිලි කිරීම**

| | |
|---|---|
| ✓ නො බැසැ ම | - අඩු නොවී |
| ✓ නො නැඟැ ම | - වැඩි නොවී |
| ✓ සිත නටවන්නේ | - සිතවන්නේ, හිතෙන්නේ |
| ✓ දිසා මාරුවක් | - පැති මාරුවක් |
| ✓ තියුණු | - සියුම්, තීක්ෂණ |
| ✓ පරීක්ෂාකාරී වීම | - විමසිලිමත් වීම |
| ✓ භයංකර | - බියකරු, බිය ගෙන දෙන |
| ✓ පාදයෝ | - කකුල්/පා |
| ✓ අලි වැළක් | - අලි පේළියක් |
| ✓ මුඛ | - කවුළු/ජනේල |
| ✓ මහත් ගණනක් | - විශාල ප්‍රමාණයක්/වැඩි ගණනක් |
| ✓ දක්ෂිණාංශයේ | - දකුණු පැත්තේ (දක්ෂිණ+අංශයේ) |
| ✓ වාමාංශයේ | - වම් පැත්තේ (වාම+අංශයේ) |
| ✓ විවරය | - සිදුර, විවෘත වූ කොටස |
| ✓ මැද'තුරෙහි | - මැද හරියේ (මැද+අතුරෙහි) |
| ✓ අනාදි කාලයක් | - ඉතා ඈත කාලයේ සිට |
| ✓ මස් බුදින්නෙක් | - මස් කන්නෙක් |
| ✓ ලැබූ දශාව | - ලැබූ කලදසාව |
| ✓ අප්‍රතික්‍රියාවස්ථාව | - ප්‍රතිකර්මයක් කළ නො හැකි අවස්ථාව (අ+ප්‍රති+ක්‍රියා+අවස්ථාව) |
| ✓ කඳ මැදට | - ඉතා සමීපයට (කට ළඟට ම) |

## අවබෝධය

1. අලියාට ඇසුණු හූවෙහිත්, හිවල් හූවෙහිත් වෙනස කුමක් ද?
2. අලියා වේගයෙන් දිවූ බව හැඟවෙන වාක්‍යය උපුටා දක්වන්න.
3. අලියා තමන් දුටු අමුතු සතාගේ විශාලත්වය ප්‍රකාශ කළේ කෙසේ ද?
4. මෙහි දැක්වෙන සතාගේ ආහාරය කුමක් විය හැකි යයි ඔබ සිතන්නේ ද?
5. අලියා දුටු අමුතු සතාගේ බාහිර ලක්ෂණ සරලව පැහැදිලි කරන්න.

- **අවබෝධය**

1. හිවල් හූව නඟී, බසී, නඟී, බසී. නො වේ. අලියාට ඇසුණු හූව නො බැසැ මැ, නො නැඟැ මැ, එක් පමණට පැවැති තියුණු හඬෙකි. එබඳු නැඟීමෙක් බැසීමෙක් මේ හඬෙහි නුවූයේ යැ.

2. තොප එදා මා වන මැදට ගෙනැ ගිය තරම් ඉක්මනට මට එය සිතීම ද නො හැකි යැ.

3. මා වැනි අලි දහසක් එක් තැන් වී, හිසින් හිස දී සිටි දෙදෙනා බැගින් පන්සියයක් පෙළට සිටැ, එසේ සිටියවුන් පිටැ නැඟී ඉතිරි පන්සියය සිටිය හොත්, ඒ සතාගේ දිගට මහතට සරිලන අලි වැළක් වෙති යි සිතමි.

   (මා වැනි අලි දහසක් එක තැනකට වී හිසට හිස තියා දෙදෙනා බැගින් පන්සියයක් පෙළට සිටගෙන එලෙස සිටින අයගේ පිට නැගී අනිත් අලි පන්සියය සිටියහොත් මේ සතාගේ දිගට මහතට සරිලන අලි වැලක් යැයි මට සිතේ)

4. ගල් අඟුරු/ ඩීසල්(පෙට්‍රෝලියම් තෙල්)

5. ඒ සතාගේ හිස මගේ මේ මහ හිසට වඩා කුඩා වුවහොත් මඳකි. ඇසෙන් විශාල ආලෝකයක් නිකුත් වෙයි. සුදු පාට එම ආලෝකය ගව්වක් පමණ දුරට නිකුත් වෙයි. හොඳ කල්පනාවෙන් සිටියත් ගණන් කිරීමට නොහැකි තරම් විශාල කකුල් ගණනක් තිබෙයි. එකට එක ළං ව දකුණු පැත්තෙහි මුඛ (කවුළු) විශාල ගණනක් තිබෙයි. වම් පැත්තේ කවුළු තිබුනා ද යන්න නො දනිමි. හිස් මුදුනෙහි නාසයක් ඇත් ද, කටක් ඇත් ද යන්න නො දන්නා මුත් එය විශාල සිදුරකි. එයින් මහ කළු වලාකුළු වැනි යමක් නිකුත් වන අතර ඒවායේ මැද හරියේ දීප්තිමත් තරු වැනි දේවල් විශාල ගණනක් ද වෙයි.

## ලිඛිත අභ්‍යාස

1. අර්ථය සෘජුව ම නො කියා වක්‍රව කියැවෙන වැකි කීපයක් පහත දැක්වේ. ඒවායේ සෘජු අදහස ලියා දක්වන්න.
   i. 'අසලැ වූ ගසෙකැ අත්තක් මාගේ සොඬට පැමිණියේ යැ'
   ii. 'කොළ අත්ත ද කටට මුත් සිතට නො වන්නේ යැ'
   iii. 'මාගේ සොඬත්, වලගත් මා නොදන්වා මැ සැණින් දිසා මාරුවක් කළේ යැ'
   iv. 'මේ පුවත ඔබට කියන්නටවත් මට අවසරයක් නො ලැබෙන්නේ යැ'
   v. 'හති ලන කලැ මුඳුනින් මහ කළු වලාකුළු නික්මෙයි'

2. මෙම කතාව රචනා කර ඇති භාෂාවෙහි දක්නට ලැබෙන විශේෂතා දෙකක් ලියන්න.

- **ලිඛිත අභ්‍යාසය**

1.
   I. ළඟම වූ ගසක අත්තක් සොඬින් ගෙන කෑවෙමි.
   II. කොළ අත්ත කෑවත් එය බඩ පිරෙන්න තරම් ප්‍රමාණවත් වූයේ නැත.
   III. මගේ හොඬත් වලිගයත් මට නොදැනීම පැති මාරුවක් විය.(මට නොදැනීම මම අනිත් පැත්ත හැරුණෙමි)
   IV. මේ ප්‍රවෘත්තිය කියන්නට මම ජීවතුන් අතර නෙසිටින්නෙමි. (මිය යෑමට ද ඉඩ තිබුණි.)
   V. කෝච්චියෙන් දුමාරය (දුම් වලාකුළු) පිට වේ.

2.
✓ ඇකාරය බහුලව යොදා ගැනීම.
✓ සරල භාෂාවක් යොදා ගැනීම.
✓ කුතුහලයක් දැනවීම.

## ප්‍රායෝගික අභ්‍යාස

1. මෙම කතාව නිවැරදිව උච්චාරණය කරමින් හඬ නගා කියවන්න.
2. කුමාරතුංග මුනිදාස මහත්මාගේ වෙනත් ළමා සාහිත්‍ය කෘති සොයා කියවන්න.
3. ඊළඟ පිටුවේ දැක්වෙන්නේ ‘සකස්කඩ’ නම් පැරණි පොතෙන් උපුටා ගත් කොටසකි. එය නිවැරදි උච්චාරණයෙන් යුතුව ශබ්ද නගා කියවන්න.

## සකස්කඩ

නමඃ ශ්‍රී ඝණාය

දීපඞ්කරාහ්වය මුනීශ්වර පාදමූලේ
සන්ත්‍යජ්‍ය ලබ්ධමමෘතං කරුණාං විධාය
අත්‍යාහිතං පරිහිතං සුකෘතං විශේෂාත්
සිද්ධං නමෝස්තු සුගතාය ජගද්ධිතාය.

අප තථාගතයන් සංසිද්ධාශේෂ සම්භාර විශේෂ සාක්ෂාත්කරණීය සර්වපාපමලප්‍රක්ෂාලනක්ෂම ආත්ම මෝක්ෂ නිරපේක්ෂ වැ, උදයව්‍යය භඞ්ග භයාදීනවාදි නවමහා විදර්ශනඥාන පරම්පරාධිගත නිර්වාණ මහා සසරට පරිධාවමාන සමස්ත සත්ත්ව මාතඞ්ගයා මහා කරුණාඞ්කුශයෙන් හම්න වැ, ජාති ජරා භඞ්ග භඞ්ගීභඞ්ග භයානක රාගද්වේෂාමර්ශ මදමාන සාරම්භාදික්ලේශ මකර නිකරාකීර්ණ සංසාර මහාර්ණවාවතීර්ණ ද්වාෂෂ්ටි දෘෂ්ටිජාලාවබද්ධ, සර්වසත්ත්ව සමුද්ධරණානුබද්ධ බුද්ධි ඇති වැ

කායජීවිත නිරපේක්ෂාභිජාත නිර්භරාභ්‍යාහිත සර්වලෝකෛකදීපායමාන දීපඞ්කර තථාගත ව්‍යාකරණාභිෂේකයෙන් උදීණක්ලේශමලාපගම කොටැ නිර්මල වැ අනේක මුක්තිමුක්තානුයාත සම්‍යක් සම්බෝධි සම්භාර භාරාලඞ්කාරයෙන් සමලඞ්කෘත වැ-ශශ්ව-දූපාස්‍යමාන පාරමිතා දූතිකානුනීයමාන ධර්ම රාජ්‍ය ලක්ෂ්මී සඞ්ගම ගමන මඞ්ගලයට ආරම්භ කොටැ...

# විශේෂණ පද

- කිසියම් පදයක් විස්තර කෙරෙමින් ඊට ඉදිරියෙන් යෙදෙන පද විශේෂණ නමින් හැඳින්වේ. උදා:-

    - ✓ කළුවර දවසකි
    - ✓ දිග හූවක්
    - ✓ උස ළමයා
    - ✓ ලොකු පොත
    - ✓ දිග මේසය
    - ✓ නපුරු බල්ලා

**ලිඛිත අභ්‍යාස**

1. විශේෂණ පද සහිතව ලියා ඇති නාම පද පහක් පාඩමෙන් උපුටා ලියන්න. විශේෂණ පදය යටින් ඉරක් අඳින්න.
2. පහත සඳහන් විශේෂණ පද, එක් පදයක් නාම පද දෙකක් සමග වන ආකාරයට යොදා වචන දහයක් සකස් කර ලියන්න.

    i. සුදු     ii. කුඩා

    iii. උස     iv. සිනිඳු

    v. දීර්ඝ
3. ඉහත අභ්‍යාසයේ දී සකස් කළ විශේෂණ සහිත නාම පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

- ලිඛිත අභ්‍යාසය

1.

- හිවල් හූව
- දරුණු සතකු
- මහත් ආලෝකයක්
- මහත ශරීරයක්
- කළු වලාකුළු

2.

I. සුදු - සුදු අශ්වයා, සුදු මල්ලී
II. කුඩා - කුඩා නිවස, කුඩා දූපත
III. උස - උස මිනිසා, උස ගස
IV. සිනිඳු - සිනිඳු රෙද්ද, සිනිඳු කඩදාසිය
V. දීර්ඝ - දීර්ඝ මාවත, දීර්ඝ නාට්‍ය

3.

I. අස්තාලයේ සිටින සුදු අශ්වයා වේගයෙන් දුවයි.
II. සුදු මල්ලී තම මවගෙන් කිරි ඉල්ලා හඬයි.
III. කාර්යශූර ගොවියා තම කුඩා නිවස කඩා අලුත් නිවසක් සෑදුවේය.
IV. අපි හතර පැයක් පමණ යාත්‍රා කොට කුඩා දූපත වෙත ළඟා වූයෙමු.
V. උස මිනිසා බස් රථයට නැග්ගේ ය.
VI. මිනිසා උස ගස කපා බිම දැමුවේ ය.
VII. අම්මා සිනිඳු රෙද්ද ගෙන කොට්ට උරයක් මැසුවා ය.
VIII. මගේ පොතේ තිබූ සිනිඳු කඩදාසිය නංගී ඉරා දැමුවා ය.
IX. අපි දීර්ඝ මාවත දිගේ ගමන් කර ගමනාන්තයට ළඟා වූයෙමු.
X. මම දීර්ඝ නාට්‍ය නරඹා වෙහෙසට පත් වූයෙමි.

## මූලික වදන් හා සංකල්ප

- ✓ නිවැරදි උච්චාරණය - අක්ෂර හා විරාම ලක්ෂණ පිළිබඳ සැලකිලිමත් වෙමින් හැඟීම් දනවන පරිදි උච්චාරණය කිරීම.
- ✓ හඬ පාලනය - අර්ථය ඉස්මතු වන පරිදි හඬ උස් පහත් කරමින් කියවීම.

## ගුණාත්මක යෙදවුම්

- ✓ සකස්කඩ කෘතිය
- ✓ කියවන නුවණ 6 වන ශ්‍රේණිය - කුමාරතුංග මුනිදාස
- ✓ හීන් සැරය - කුමාරතුංග මුනිදාස

# අලියෙක් කතා කරයි.........



එදා කළුවර දවසක්....ඉර බැස ගොස් පැය හතරක්වත් ගත වුණේ නැහැ. එදා මගේ බඩ පිරෙන්නට කෑමක් ලැබුණෙ නැති නිසා ළඟ ම තියෙන ගම්මානයට ගොස් කුඹුරකට වැදිලා ගොයම් ටිකක් කන්න රෑ වෙනකම් තමයි, බලාගෙන හිටියෙ.ඒ අතර තුර වැඩිය රස නැති වුණත් ළඟ ම තිබුණු ගසක අත්තක් සොඬින් ගෙන කෑවත් මගේ බඩ පිරෙන්න තරම් ප්‍රමාණවත් වුණේ නෑ.

මේ අතර දිග හූ.. හඬක් ඇහෙන්නට වුණා. මීට පෙර මම අසා තිබූ නරියන්ගේ හූ ... හඬට වඩා මේ හඬ වෙනස්. නරින්ගෙ හූ.. හඬ නම් නඟී,බසී, එහෙත් මේ හඬ අඩු නොවී වැඩි නොවී එක දිගට ම ඇහුණා.මම යන්නට හිතාගෙන හිටපු ගමන මගේ සිතින් අයින් වුණා. නුපුරුදු හඬක් ඇසුණු විට අප ටිකක් පරීක්ෂාකාරී වෙන්නත් ඕන නිසා මාත් විමසිලිමත් වුණා.

වැඩි වෙලාවක් යන්නට වුණේ නෑ.මගේ හොඬත්,වලිගයත් මට නොදැනි ම පැති මාරුවක් වුණා.මා උඩ ගියා සේ මට දැනුණා.

මා අසලින් එවර දැනුණු හූ.. හඬ තියුණු ය. එමෙන් ම බිය දනවන සුළු ය.

ඒ හඬ දරුණු සතෙක්ගෙන් ආ බව මට වැටහුණා.බිය මට පුරුදු දෙයක් නොවන බව ඔබ දන්නවත් ඇති.ඒත් මට නුපුරුදු ඒ බිය දැනෙන්න පටන් ගත්තා.ටික වේලාවකට පසුව ඒ සතා අහස පොළව දෙදරාගෙන එනු මට පෙනුණා.

මගේ දෙපා කොතරම් දක්ෂ දැයි මට සිතුනේ එදා ය.වෙනදාට මගේ සිත දැනුම් දුන් විට පමණක් දෙපා සෙළවේ.මගේ දෙපා එලෙස ඉක්මන් නොවුනා නම් මේ කතාව ඔබට කියන්නටවත් මට අවසර නැත.අනේ පාදයනි, තොපට පින් සිදු වේවා!එදා මට තොපට පින් දෙන්නටවත් සිහියක් නොතිබිණි. ඒ ගැන මට සමාව දෙනු මැන,



කැළය මැදි දී මා බියෙන් වෙවුලන්නට විය.. මදක් පසු පස හැරී බැලුවෙමි.භයානකය! ඒ සතා ඇදුණු සැටි පළමු වරට මා දුටුවේ ය. ඒ සතාගේ හිස මගේ මේ මහ හිසට කුඩා වුවොත් මදකි. ඒ ඇසින් විශාල ආලෝකයක් නිකුත් විය.එම ආලෝකය ගව්වක් පමණ දුරට නිකුත් විය.එය සුදු පාට ය. මට ඒ ඇස දකින්නට ලැබුණේ ටික වේලාවකි.ඒ තරම් වේගයෙන් සතා ඇදී ගියේ ය.පුදුමයකි. ඒ සතාගේ දිග මහත! මන් වාගේ අලි දහසක් එක තැනකට වී හිසට හිස තියා දෙදෙනා බැගින් පන්සීයක් පෙළට සිටගෙන එසේ සිටින අයගේ පිට නැඟ අනිත් අලි පන්සීය  සිටියොත් මේ සතාගේ දිග මහතට සරිලන අලි වැලක් යැයි මට හිතේ.

මේ ගණන මට සිතුණේ පසුවය. එවේලේ නම් එය මතක් වූයේ ද නැත.කකුල් විශාල ගනණක් තිබුණා.හොඳ කල්පනාවෙන් සිටි විටකවත් එය ගනණ් කිරීමට නොහැකි ය.ගමන ඒ තරම් ම වේගවත් ය. ඒ සතාගේ කවුළු විශාල ගණනක් විය.ඒවා එකට ළං ව පිහිටා තිබුණා. මා සිටියේ සතාට දකුණු පැත්තෙන් ය. වම් පැත්තෙන් කවුළු තිබුණා ද යන්න  නොදනිමි. දකුණු පැත්තේ කවුළුවලින් නම් එලියක් විහිදුණේ ය.



ඒ සතාගේ ගමන තමයි ,ගමන එතරම් දිග මහත ශරීරයක් ඇති සතෙක් අහස පොළව දෙදරා ගෙන ඒම පුදුමයක් නොවේ.පුදුමයට කාරණය නම් ,දිවිමින් හති දැමීමයි. එය ගව්වක් දුරට ඇසේ.කැලෑ මඳුනින් විශාල කළු වලාවක් නැගේ.හිස මුඳුනේ නාසය ද කට ද යන්නට සිතා ගැනීමට නොහැකිය. මොකක් වුවත් එහි සිදුර විශාල ය. එයින් නික්මූ කළු වලාව නිකම් කළු වලාවක් නොවේ. මැද හරියෙහි ඉතා විශාල ගනණක් වූ දීප්තිමත් තාරකාවන් ය.


ඉතින් මේ සතා ගැන ඔබට ඇති වන හැඟීම කෙසේ ද?

අපි,මේ වනයේ ඉතා ඈත කාලයේ සිට ම වාසය කළෙමු.ඇත්ත වශයෙන් ම අපගේ හැගඟීම වූයේ මේ අපට උරුම වූ වනයක් කියා ය. එය වෙනස් කිරීමට කාලය දැන් එළඹ ඇත. ඒ සතාගේ අහාරය කුමක් දැයි කිවීමට නොහැකි ය. මස් කන්නෙක් නම් දවසකට අලින් පනහක්වත් මදි වේ. ගහ කොළ කන්නෙක් නම් මේ වනය දින හත අටකට වඩා නොසෑහේ. ඒ කුමක් වුවද අපට ලැබූ කල දසාව භයංකාර ය. ප්‍රතිකාරයක් කළ නොහැකි අවස්ථාවක් ඉතා සමීපයට පැමිණ ඇත. ඒ නිසා වාසයට වෙනත් වනයක් සොයා ගත යුතු බව මගේ අදහසයි.



‘සකස්කඩ නොකී කට

උගේ කට හුඹස් කට’





**සකස්කඩ යනු:**
**සංස්කෘත පද බහුල මිශ්‍ර භාෂාවෙන් රචිත බුද්ධ චරිතයකි.මෙය දොරකඩ අස්න වෙනුවට සත් දවසේ පිරිත් කිවීමේදී භාවිත වූවක් බව අග රතන සූත්‍රයේ සඳහන් කොට ඇත.එහෙත් පමාව බුද්ධ ගද්‍යය සේ ම දරුවන්ට අකුරු පුරුදු කරවන පාඩම් පොතක් සේ භාවිත ව ඇත.මේ දෙක අත්ගම රාජගුරු බණ්ඩාර පඬිතුමාගේ කෘති බව සමහරු සලකති. (බළන්ගොඩ ආනන්ද මෛත්‍රී ස්වීවර)**


- අකුරු කරන්නට ම ලියවුණු පැරණි පොත් දහ අටකි.
  **අනුරුද්ධ ශතකය,බෞද්ධ ශතකය,සූර්යය ශතකය,වෘත්ත මාලාව,වෘත්ත මාලාඛ්‍යාව,අමරසිංහය,සකස්කඩ, හෝඩිය,නම් පොත,මඟුල් ලකුණ,ගණ දෙවි හැල්ල,වදන් කවි පොත, බුද්ධ ගජ්ජය,නමාෂ්ට ශතකය, නවරත්නය,ව්‍යාසකාරය,හිතෝපදේශය,ප්‍රත්‍යය ශතකය**












NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය : පැය 1 |
|---|---|---|

**7 වන පාඩම - අලි උවදුර**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය වන්නේ

1) 1) ප්‍රබන්ද 2) ප්‍රභන්ද 3) ප්‍රභන්ධ 4) ප්‍රබන්ධ

2) 1) විශේෂ 2) විශේශ 3) විසේශ 4) විසේෂ

- නිවැරදි අක්ෂරය යොදා හිස්තැන් පුරවන්න.

3) ශ්‍රේ _____ ය (ණි / නි)

4) ප්‍රමු _____ (ඛ / ක)

5) නිර්මා _____ ය (ණ / න)

6) උච්_____ රණය (චා / ඡා)

7) අලි උවදුර පාඩම උපුටා ගත් කෘතිය වන්නේ
1) මගුල් කෑම 2) කියවන නුවණ 3) හත්පණ 4) හීන් සැරය

8) එම ග්‍රන්ථය රචනා කළ කතුවරයා කවු ද?

9) එම කතුවරයා විසින් රචිත වෙනත් ග්‍රන්ථ 3ක් ලියන්න.

10) අලි උවදුර පාඩමේ ඔබට හැඟෙන සතා කවුරුන් ද?

- පහත සඳහන් වගන්තිවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

11) ''අසලැ වූ ගසෙකැ ඇත්තක් මාගේ සොඬට පැමිණියේය.

12) ''අප්‍රතික්‍රියාවස්ථාව කඳ මැදට මැ පැමිණෙන්නට පළමු වනයෙම වෙන වනයක් ''

- පහත සඳහන් වගන්තිවල අවස්ථා සම්බන්ධය ලියන්න. (කවුරු විසින් කා හටද)

13) ඒ සතාගේ ගමන තමා ගමන !

14) '' මා යන්නට සිතා සිටි කුඹුර මගේ සිතින් ඈත් වියැ,''

15) පහත සඳහන් ගී කොටස කියවා එහි ඇති විශේෂණ පද යටින් ඉරක් අඳින්න.

පුංචි කුඩුවක කැළයේ
සැළලිහිනි ජෝඩුවක් උන්නා
ලස්සන සිංදු කියලා
පොඩි පුතා නැලෙව්වා දෙන්නා


(ල. 2 x 15 = 30)

- පහත සඳහන් වාක්‍යවලට සුදුසු ආඛ්‍යාත පදය යොදන්න.

16) තරු අහස පුරා නැග ..........................................
17) කුරුල්ලෝ අහසේ .............................................
18) ගංගා ගලා .........................................
19) ගංගාවෝ ගලා .......................................
20) මී මැස්සෝ මී වද .................................
21) ළමයි සෙල්ලම් ..............................
22) ගුරුවරු දරුවන්ට අවවාද ...............................
23) සිංහල භාෂා තරගයට මම පෙනී ................................
24) අපි සරුංගලය .....................................
25) නුඹලා සෙල්ලම් ................................ (ල. 10)

26) කුමාරතුංග මුණිදාස ශූරීන් පිළිබඳ කෙටි රචනයක් ලියන්න. (ල. 10)

# සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය



විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය
වාරය : දෙවන වාරය

ඒකකය - අලි උවදුර

නිපුණතාව : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම : 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

අරමුණු

- නිවැරදි හා පැහැදිලි උච්චාරණයෙන් යුතු ව කියවයි.
- නිසි හඬ පාලනයෙන් යුතු ව කියවයි.
- විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.

# සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය

## 1. හිස්තැනට සුදුසු පිළිතුර කොටුව තුළින් තෝරන්න

I ........ සිංහල භාෂා සාහිත්‍ය ක්ෂේත්‍රයේ සුවිශාල සේවයක් කළ පඬිවරයෙකි.
II හත්පණ, හීන්සැරය, මඟුල් කෑම එතුමන් විසින් ළමයින් සඳහා රචිත ........ වේ.
III ........ ආදිය එතුමා විසින් රචිත පද්‍ය කෘති අතර වේ.
IV අලි උවඳුර පාඩම ........ කෘතියෙන් උපුටා ගන්නා ලදී.
V මුනිදාස කුමාරතුංගයෝ ........ නමින් හඳුන්වති.

| ප්‍රබන්ධ | හෙළයේ මහ පඬිරුවන | කියවන නුවණ | කුමාරතුංග මුනිදාස | කුමර ගී |
|---|---|---|---|---|

## 2. අර්ථය ගැළපෙන සේ යා කරන්න.

| අ | ආ |
|---|---|
| කටට මුත් සිතට නො වන්නේ ය . | පිළිවෙත නො වේ ද? |
| අත්තක් මගේ සොඬට පැමිණියේ යැ | හොඬවැලෙන් අත්තක් කඩා ගත්තේ ය. |
| මගේ සිතින් ඇත් විය. | සිතට සිතෙනුයේ |
| සිත නටවන්නේ | කොළ කන බව සිතට නොදැනෙයි. |
| සිරිත නෝ | මට අමතක විය. |

## 3. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I නිවැරදි ව හා නිරවුල් ව වචන උච්චාරණය සඳහා ලිය වී ඇති පැරණි ග්‍රන්ථය කුමක් ද?
II පැරණි පඬිවරුන් විසින් නිවැරදි ව කියවීම හා ලිවීම හුරු කිරීමට ලියන ලද වෙනත් පොත් තුනක් නම් කරන්න.
III ගද්‍ය හෝ පද්‍ය පාඨයක උච්චාරණය පහසුවෙන් කිරීමට ඔබ කළ යුත්තේ කුමක් ද?
IV කුමාරතුංග මුනිදාස සූරීන් විසින් රචිත ළමා සාහිත්‍යය කෘති අතුරින් ඔබ වඩාත් සිත් ගත් අවස්ථාවක් පිළිබඳ අදහස් දක්වන්න.

**4. පහත සඳහන් ප්‍රකාශ හරි නම් හරි (✓) ලකුණ ද වැරදි (X) නම් වැරදි ලකුණු ද යොදන්න.**

I යම් පුද්ගලයෙක්, යම් දෙයක් පිළිබඳ පමණක් හඳුන්වන පද නාම පදවලට අයත් වේ. ( )

II යම් නාම පදයක් විස්තර කරන,වර්ණනා කරන පද නාම විශේෂණ පද වේ. ( )

III 'නටයි' යනු ක්‍රියා විශේෂණ පදයකි. ( )

IV යම් ක්‍රියා පදයක් විස්තර කරන, වර්ණනා කරන පද ක්‍රියා විශේෂණ පද වේ. ( )

V විශේෂණ පදවල විශේෂ්‍ය හා විශේෂණය යනුවෙන් කොටස් දෙකක් දක්නට ලැබේ. ( )

**5. සුදුසු නාම විශේෂණ පදය කොටුව තුළින් තෝරා යොදන්න.**

I …….. ළමයා පව් නො කරයි.

II …….. නංගී සිනාසෙයි.

III අම්මා අද …….. බත් ඉව්වා ය.

IV …….. අයියා පාඩම් කරයි.

V …….. පැටියා උඩ පැන පැන නටයි.

කහ | සුදු | හොඳ | වසු | ලොකු

**6. දී ඇති ඡේදයේ ඇතුළත් විශේෂණ පද රවුම් කරන්න.**

ලස්සන ගමක ගැහැණු ළමයෙක් හිටියා. එයාට ගමේ හැමෝ ම කතා කළේ රතු හැට්ටකාරී කියලා. ඉතින් මේ රතු හැට්ටකාරී දවසක් තීරණය කළා එයාගේ අත්තම්මා බලන්න යන්න. මේ අත්තම්මාගේ ගෙදරට යන්න තුබුණේ ලොකු කැලෑවක් මැදින්. ඉතින් කැලෑව මැදින් මේ රතු හැට්ටකාරී යනකොට එකපාරට ම භයානක සද්දයක් ඇහුණා.

# පිළිතුරු



## Answer

NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

**දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

| 6 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය : පැය 1 |
|---|---|---|

1. ප්‍රබන්ධ
2. විශේෂ
3. ශ්‍රේණිය
4. ප්‍රමුඛ
5. නිර්මාණය
6. උච්චාරණය
7. කියවන නුවණ
8. කුමාරතුංග මුනිදාස මහතා
9. හත්පණ, හීන්සැරය, මඟුල්කෑම
10. කෝච්චිය/ දුම්රිය
11. ළඟම වූ ගසක අත්තක් සොඬින් ගෙන කෑවෙමි.
12. ප්‍රතිකර්මයක් කළ නො හැකි අවස්ථාව ඉතා සමීපයට (කට ළඟට ම) පැමිණෙන්නට පෙර ජීවත් වෙන්නට වෙන කැළෑවක්
13. අලියා විසින් තම කතාව අසා සිටින අයට
14. අලියා විසින් තම කතාව අසා සිටින අයට
15. <u>පුංචි</u> කූඩුවක කැළයේ  
<u>සැළලිහිනි</u> ජෝඩුවක් උන්නා  
<u>ලස්සන</u> සිංදු කියලා  
<u>පොඩි</u> පුතා නැලෙව්වා දෙන්නා
16. තරු අහස පුරා නැග **එයි.**
17. කුරුල්ලෝ අහසේ **පියාඹති.**
18. ගංගා ගලා **බසියි.**
19. ගංගාවෝ ගලා **බසිති.**
20. මී මැස්සෝ මී වද **බඳිති.**
21. ළමයි සෙල්ලම් **කරති.**
22. ගුරුවරු දරුවන්ට අවවාද **දෙති.**
23. සිංහල භාෂා තරගයට මම පෙනී **සිටිමි.**
24. අපි සරුංගලය **යවමු.**
25. නුඹලා සෙල්ලම් **කරහු.**

## 26. "කුමාරතුංග මුණිදාස ශූරීන්"

කුමාරතුංග මුනිදාස සිංහල භාෂා සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි විශාල පෙරළියක් සිදු කළ පඬිවරයෙකි. ලංකාවේ ජීවත් වූ ශ්‍රේෂ්ඨ පඬිවරයකු, සාහිත්‍යකරුවකු, ගුරුවරයකු, ගුරුවරු පුහුණු කරන්නකු, ප්‍රකට වාග් විශේෂඥයකු, පාසල් පරීක්ෂකවරයකු, කවියකු ලෙස විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සිය විශේෂ නිපුණත්වය විශද කළ කුමාරතුංග මුනිදාසයන්, 1887 ජුලි මස විසිපස් වැනි දින දික්වැල්ලේ, ඉඳිගස් ආරේ සිය නිවෙසේදී උපත ලැබීය. දෙස, බස, රැස වෙනුවෙන් අමිල මෙහෙවරක නිරත වූ වියත් පඬිරුවනක් වන කුමාරතුංග මුනිදාසයන්, මෙරට සාහිත්‍ය වෙනුවෙන් කළ මෙහෙය ද සුවිශේෂී ය. කුමාරතුංග මුනිදාස යනු, නූතන සිංහල ළමා සාහිත්‍යයක් බිහි කිරීමට පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ, අමරණීය මිනිසෙකි.

ඔහු ළමා සාහිත්‍ය වෙනුවෙන් කළ අපරිමිත මෙහෙවර පිළිබඳ සියල්ලෝම හොඳින් දනිති. ආනන්ද රාජකරුණා, සිකිම් මහින්ද හිමි වැනි ළමා සිත් හඳුනා ගනිමින් ළමා සාහිත්‍යයක් බිහි කිරීමට මඟපෑදූවෝ ඔහුගේ අනෙක් සමකාලීනයන් ය. ඔවුන් අතින් හරවත්, රසවත් ළමා පැදි කෙතෙක් බිහි වුණ ද, ළමා ගද්‍ය සාහිත්‍යයක් ලෙස සැලකිය හැකි ප්‍රබන්ධ විශේෂයක් ප්‍රථම වරට රචනා කරන ලද්දේ කුමාරතුංග මුනිදාසයන්ය. 'හත්පණ', 'මගුල් කෑම', 'හීන් සැරය' වැනි ළමා කතන්දර පොත් ද, 'කුමර ගී' වැනි ළමා පැදි පොත් ද 'ශික්ෂා මාර්ගය', 'කියවන නුවණ', 'අකුරු සැහැල්ල' වැනි පාසල් පොත් ද, ලාංකේය ළමා සාහිත්‍යය පෝෂණය වෙනුවෙන් ඔහු අතින් ලියැවුණු කෘති ය. එදා ඔහු අතින් ලියැවුණු එම පොත්, අද වනවිට ද ළමා මනසට ආමන්ත්‍රණය කිරීමට සමත්වීම, ඔහුගේ සාහිත්‍ය නිර්මාණවල ප්‍රබලත්වය කියා පාන කදිම සාක්ෂියකි. ඔහුගේ ප්‍රබන්ධකරණයට සියවසක් පමණ කාලය ගතවී ඇත ද, අද වනවිටත් කුමාරතුංගයන් රචනා කළ නිර්මාණ පාසල් විෂය නිර්දේශයන්ට එක්කර තිබීම, ඔහුගේ කෘති නිර්දේශිත කියවීම් පොත් ලෙස පරිශීලනයට යොමු කිරීම මඟින්, එතුමා බිහි කළ සාහිත්‍යයේ වටිනාකම මනාවට පෙන්වයි.

සිරිමත් මගෙ සකි
යහපත් ළමයෙකි
නුවණත් ඇත්තෙකි
වැඩටත් සමතෙකි

උදය ම පුබුදී
මුහුණට දිය දී
කුළ දෙවි නමදී
ගේ දොර අමදී

පාඩම් කරනට
පත පොත ගෙන සිට
සිත වෙන දෙයකට
නො හරියි කිසිවිට

මේ ඔහුගේ සහජ කවීත්වය ඔප්නැංවෙන නිර්මාණයකි. ළමා පරපුර කෙසේ විය යුතුද? යහපත් දරුවකු ලෙස සමාජගත වූ දරුවකු තුළ ඇති චර්යා කෙබඳුද? යන්න පිළිබඳ මේ කාව්‍ය මඟින් අනාවරණය වේ. 'යහපත් දරුවකු නම් මෙසේ කටයුතු කරන්න. ඔහු මේ මේ විදිහට ජීවත් විය යුතුයි' යැයි ඔහු අවධාරණය කළේ නැත. ඔහුගේ සුන්දර කාව්‍ය නිර්මාණ මඟින්, සිරිමත් වැනි ළමයකු කෙතරම් හොඳද? එවැනි දරුවකු ලෙස තමන්ද ජීවත් වියයුතු නොවේද යන්න මෙය කියවන පාඨකයා තුළ රුචියක් උපදිනු ඇත. හොඳ නරක නිසි පරිදි වටහා දීමට උපදෙස් දෙන අපූර්ව පද්‍ය රචනාවක් ලෙස ද මේ පද්‍ය පන්තිය හඳුනාගත හැකිය.

ළමයා යනු, අව්‍යාජ සිතිවිලි ඇති, නිදහසේ ජීවත් වන, පිවිතුරු සිතිවිලිවලින් ගහණ අයෙකි. එවැන්නකුට වැඩිහිටියන් ලෙස නිසි මඟපෙන්වීමක් කළ යුතු ය. එසේ නොවුණොත්, එම දරුවාගේ ජීවිතය නරකට යොමු වීමට ඇති ඉඩකඩ ද වැඩි ය. එහෙත්, කුමාරතුංගයන්ගේ මේ කවි සංකල්පනා කියවන ළමා පාඨකයා, වැඩිහිටි බල කිරීමකින් තොරවම යහපත් ජීවිතයක් ගොඩනගා ගැනීමට පෙලඹේ. සාහිත්‍ය මඟින් එවැනි යහපත් බලපෑමක් කිරීමෙන්,සදාචාරවත් පුද්ගලයකු බිහි කිරීමට ඔහුගෙන් ඉටුවූ මෙහෙය අපමණ ය. ළමා මනස නිසි පරිදි හඳුනා ගත් ඔහු, වැඩිහිටියකු ලෙස ළමා පරපුරේ උන්නතිය උදෙසා කළ සේවය අපමණය.

මෙතුමන් ශ්‍රී ලෙස සලකනු ලබයි. ඔහු අන්‍ය සාහිත්‍යකරුවන් අතරින් විශේෂ වුයේ ඔහු තුළ පැවති අසාමාන්‍ය භාෂා ඥානයත්, නිර්මාණශීලී චින්තනය සඳහා සිංහල භාෂාව හැසිරවීමත් නිසාය. සිංහල, පාලි, සංස්කෘත භාෂා හැසිරවීමේ හසල දැනුමත් සහිත වූ මෙතුමා දමිළ, මලයාලම්, ඉංග්‍රීසි, ලතින් සහ ග්‍රීක් භාෂා හැසිරවීමේ දක්ෂයකු විය.

ඔහුගේ "හාවාගේ වග" නම් පැදි පෙළ,ළමා නිර්මාණ අතරින් අතිශය සාර්ථක ළමා පද්‍ය නිර්මාණයක් ලෙස හඳුනාගත හැකි ය. මින් කියැවෙන්නේ, හාවකු පිළිබඳවය.

"හා හා හරි හාවා කැලේ මැදින් ආවා
හිටගෙන ගඟ ගාවා වට පිට ඇහැ ලෑවා

කොළ දෙකටක් කෑවා පැන් උගුරක් බීවා
තොල කට ලෙව කෑවා ඉතින් ඇතැයි කීවා

තඹා නිකට ගාවා වීණාවක් පෑවා
මිහිරි සිංදු කීවා නැටුම් ටිකක් පෑවා

එයින් වෙහෙස වූවා ඉඳගෙන හතිලෑවා
තණබිස්සේ බාවා ඇඟපත සැතැපූවා"

මේ කවි කියවනවිට, හාවාගේ හැසිරීම් රටාව පුංචි සිත්වල මැවේ. එසේ මැවෙන චිත්තරූප මඟින් ළමයා අපූර්වත්වයක් විඳියි. ඒ අපූර්ව ලෝකය තුළ දරුවා සැරිසරයි. ඒ සැබැවින් ම ළමා ලෝකයයි. ඒ ලෝකය මැවීම සඳහා ඔහු යොදාගෙන ඇත්තේ සරල, සුගම, සුලලිත බස් වහරකි.

එපමණකුදු නොව, යටත් විජිත සමයේ දී බ්‍රිතාන්‍ය බලපෑම් නිසා, විශේෂයෙන් ම (19) වැනි ශතවර්ෂයේ මුල් භාගයේ සිටම සිංහල සාහිත්‍යයේ පිරිහීමක් දක්නට ලැබිණි. කුමාරතුංග මුනිදාස, මහගමසේකර වැන්නන් එහිදී සිංහල සංස්කෘතිය රැක ගැනීමට මහඟු පරිශ්‍රමයක් දැරීය. එසේ ම එතුමා, සාහිත්‍යකරුවකු ලෙස කටයුතු කළාක් පමණක් නොව, ලංකාවට ආවේණික සංගීත ශෛලියක් ගොඩනැගීම සඳහා පර්යේෂණ කටයුතුවල ද ඔහු නියැළුණේ ය.

අධිරාජ්‍යයන්ට ගැතිව සිටි සමයේදී, ළමා මනස තුළ තම රට, ජාතිය, ආගම පිළිබඳ හැඟුම් ජනිත කිරීම සඳහා ඔහු "පුබුදුව" නම් පද්‍ය රචනා කළේ ය. එය ළමා සිත් තුළ ජාත්‍යානුරාගය, ජාත්‍යාලය ඇති කිරීමට සමත් කාව්‍ය පන්තියකි.

"ඉදිරියටම යව් හෙළයිනි - ඉදිරියට යවු
අපගේ රටෙහිම යැද යැද
ගැති වී තව තව හිඳිමුද
නිදහස නැති දිවි කුමටද
ඉදිරියටම යවු"

රටට, ජාතියට, සාහිත්‍යයට අපමණ මෙහෙයක් ඉටු කළ කුමාරතුංග මුනිදාසයන්, (1944) මාර්තු 02 වැනිදා අප අතරින් සදහටම වෙන්ව ගියේ ය. එනමුදු ඔහු අප වෙනුවෙන්, රට වෙනුවෙන් කළ මෙහෙවර අපමණ ය. එය, මිල කළ නොහැකි මෙහෙවරකි.

.



# සිංහල භාෂාව හා සාහිත්‍යය — 6 ශ්‍රේණිය

**අලි උවදුර**

**පිළිතුරු පත්‍රය**

**1.**

I. කුමාරතුංග මුනිදාස මහතා
II. ප්‍රබන්ධ
III. කුමර ගී
IV. කියවන නුවණ
V. හෙළයේ මහ පඬිරුවන

**2.**

| අ | ආ |
|---|---|
| කටට මුත් සිතට නො වන්නේ ය. | පිළිවෙත නො වේ ද? |
| අත්තක් මගේ සොඬට පැමිණියේ යැ | හොඬවැලෙන් අත්තක් කඩා ගත්තේ ය. |
| මගේ සිතින් ඇත් විය. | සිතට සිතෙනුයේ |
| සිත නටවන්නේ | කොළ කන බව සිතට නොදැනෙයි. |
| සිරිත නෝ | මට අමතක විය. |

**3.**

I සකස්කඩ,

II ගණදෙවි හැල්ල, වදන් කවි පොත, බුද්ධ ගජ්ජය, නමාෂ්ට ශතකය, නවරත්නය, ව්‍යාසකාරය, හිතෝපදේශය, ප්‍රත්‍ය ශතකය, අනුරුද්ධ ශතකය, බෞද්ධ ශතකය,සූර්ය ශතකය, වුත්තමාලාව, වුත්තමාලාඛ්‍යාව, අමරසිංහය ( මෙම පොත් අතුරින් ඕනෑම පොත් තුනක්)

III එය කිහිපවරක් හඬ නඟා උච්චාරණය කිරීම

IV හත්පණ , මඟුල් කෑම, හීන්සැරය යන කෘති අතුරින් වඩාත් සිත් ගත් එක් අවස්ථාවක් පිළිබඳ විස්තර කර තිබිය යුතු ය.

I. ✗
II. ✓
III. ✗
IV. ✓
V. ✓

5.

I. හොඳ
II. සුදු
III. කහ
IV. ලොකු
V. වසු

6.

ලස්සන ගමක, ගැහැණු ළමයෙක්, රතු හැට්ටකාරි, ලොකු කැලෑවක්, භයානක සද්දයක්



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

**හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ